ඇතැම් මාධ්‍ය තුළ පළ වන ඇතැම් පුවත් වාර්තාවන් හෝ තීරු සටහන් ඔස්සේ කාන්තාව ඒකාකෘතික කෙරෙනා (stereotype) අවස්ථාවන් දක්නට ලැබෙන අතර, ඒ ඔස්සේ සමාජයට ලැබෙනා ප්‍රශ්නකාරී පණිවුඩයන් දෙස බලන විට, එවැනි අන්තර්ගතයන් සැබවින්ම මාධ්‍ය තුළ පළ විය යුතුදැයි පාඨක අපට ප්‍රශ්න කිරීමට සිදුවේ.

දිවයින (මාර්තු 22, 2022) "හත්වලාමයි" තීරුවේ, "'බුද්ධ පූජාව' කකුල් අස්සේ ගසාගෙන ඇවිත්' යන සිරස්තලයෙන් යුතුව පළව තිබූ ලිපිය ඊට උදාහරණයක් ලෙසින් දැක්විය හැක. තරුණියක් ස්කූටර් රථයක අසුන යට ඇති ගබඩා අවකාශය තුළ බුද්ධ පූජාවට වෙන් කළ ආහාර බඳුන තබාගෙන ඒම හේතුවෙන් ඇයට අදාළ පංසලේ විහාරාධිපති හිමියන් බරපතළ ලෙස දෝෂාරෝපණය කළ බව මෙම තීරුව තුළ දැක්වී තිබිණි. එසේම, ලිපිය ආරම්භයේදී, "මේ කියන තරුණිය අඳින්නේ කොට සායවල්ය, නැතිනම් කොට කලිසම්ය, විවාහ වී දරු පැටියෙකු ලැබුණත් අඳින පළඳින ක්‍රමය වෙනස් නොවූයේ අද කොයි කවුරුත් විළි වසා ගැනීම කෙසේ වෙතත් විළි සංගයක් නොමැතිව කටයුතු කිරීම සාමාන්‍ය දෙයක් බවට පත්ව තිබෙන නිසාය" යනුවෙන් ද සඳහන් ව තිබිණි.

1) මෙම තැනැත්තිය අඳින පළඳින්නේ "විළි සංගයකින් තොර" ආකාරයකට යැයි සඳහන් කිරීම ඔස්සේ සිදුකෙරෙන්නේ, කාන්තාව ඒකාකෘතික කිරීමට උත්සාහ ගැනීමක් නොවේද? එහිදී කාන්තාව ස්ත්‍රී පුරුෂ භාවය ඔස්සේ කොන් කිරීමක් සිදු නොවන්නේ ද?

2) ඔබ සිතනා ලෙසට, මෙම තැනැත්තියගේ ඇඳුම් පැළඳුම් පිළිබඳ විස්තර, මෙම සිදුවීමට සම්බන්ධ වන්නේ කෙසේ ද?

3) එසේම, මෙම තීරුවේ සඳහන් සිදුවීම - ස්කූටර් රථයක අසුන යට ඇති ගබඩා අවකාශය තුළ බුද්ධ පූජාවට වෙන් කළ ආහාර බඳුන තබාගෙන ඒම - වරදක් ලෙසින් රාමුගත කරන්නට ලිපියෙන් උත්සාහ ගැනීමේ පදනමක් ඔබ දකින්නේ ද?

ඔබේ අදහස?